# Renault මෝටර් රථ සඳහා සිය ප්‍රථම 3S නියෝජිත ආයතනය කුරුණෑගලදී විවෘත කළ වගයි.

මෙරට මෝටර් රථ ඉතිහාසයේ ඉතා කෙටි කලක් තුළ ජනප්‍රියතම හා වැඩිම අලෙවියක් වාර්තා කල Renault Kwid රථය ඇතුළු සියලු Renault මෝටර් රථ සඳහා එකම වහලක් යටදී සිදුකල හැකි 3S සංකල්පය සහිත (Sales, Service, Spare Parts) පළමු නියෝජිත ආයතනය පසුගියදා කුරුණෑගල දී විවෘත කරන ලදී. දශක 12 කට අධික විශිෂ්ඨ ඉතිහාසයක් සහිත Renault සන්නාමය මෙරටට ගෙන්වනු ලබන්නේ 70 වසරක් පුරාවට ශ්‍රී ලාංකිකයන්ගේ නිබඳ විශ්වාසය දිනාගත් AMW සමාගම මඟින්ය.

මෙරට පළමු 3S සංකල්පය සහිත ( Sales, Service, Spare Parts) සේවා ත්‍රිත්වය එකම වහලක් යටින් ලබාගත හැකිවන පරිදි Siyekra International පුද්ගලික සමාගම Renault මෝටර් රථ පාරිභෝගිකයන් වෙනුවෙන් විවෘත කරනලදී. AMW සමාගම හා සම්බන්ධ වෙමින් පළමුවරට 3S සංකල්පය ජනතාව අතරට රැගෙන ගිය ප්‍රථම ආයතනය ලෙස Siyekra International පුද්ගලික සමාගම හඳුන්වා දිය හැක.

Renault නාමය තවදුරටත් මෙරට ජනතාව අතර නාමගත කිරීම හා කොළඹින් බැහැර තදාසන්න ප්‍රදේශවල Renault මෝටර් රථ පාරිභෝගිකයන් හට වඩා විධිමත් හා කාර්යක්ෂම සේවාවක් ලබාදීම අරමුණු කරගනිමින් මෙම සේවා හා විකුණුම් ස්ථානය කුරුණෑගල කේන්ද්‍ර කරගනිමින් පිහිටුවා ඇත. මෙම නවතම සේවා ස්ථානය හරහා පාරිභෝගිකයන් හට සියලුම සේවා අවශ්‍යතාවයන් සම්පූර්ණ කරගත හැක.

මෙම නවතම සහයෝගීතාවය පිළිබද අදහස් දැක්වූ Renault ශ්‍රී ලංකා හි සන්නාම අධ්‍යක්ෂ ෂෙහාන් ද සොයිසා මහතා " Renault නාමය කෙටිකලක් තුළ ජනතා ආකර්ෂණය දිනාගත් සන්නාමයක් , එමෙන්ම කෙටිකලකදී වර්තාගත අලෙවියකට හිමිකම් කියන්නට Renault Kwid හරහා අපට හැකියාව ලැබුනා. මෝටර් රථ සන්නාමයක ඉදිරි පැවත්ම තීරණය කිරීමේදී අප විසින් ලබාදෙන අලෙවියෙන් පසු සේවාවන් අසමසම වගකීමත් පාරිභෝගික ප්‍රසංශාවට හැමවිටම ලක්වන කරුණක් බව කිව යුතුයි. එදා මෙදා තුළ පාරිභෝගිකයන් වෙත ලොව ප්‍රමුඛතම සන්නාමයන් හඳුන්වා දුන්, හඳුන්වා දෙන ආයතනයක් ලෙස AMW සමාගම ඉදිරියෙන්ම සිටිනවා. ඉතින් එම කරුණු පෙරදැරි කරගෙන අප මෙම නව සංකල්පය අපගේ ආදරණීය පාරිභෝගිකයන් වෙත හඳුන්වා දෙන්නට Siyekra International ආයතනය හා සමඟ අත්වැල් බැඳ ගත්තා". ඒ මහතා තවදුරටත් අදහස් දක්වමින් කියාසිටියේ "කුරුණෑගල අවට හා ඉන් බැහැරව සිටින ඕනෑම Renault මෝටර් රථ පාරිභෝගිකයන් හට එකම වහලක් යටින් සියලු සේවාවන් හා අමතර කොටස් මිලදී ගැනීම දක්වා සිදුකර ගත හැක. එමගින් ඔවුන්ගේ වටිනා කාලය

මෙන්ම මුදල්ද ඉතිරිකර ගැනීමට හැකියාව ලැබෙනවා. එමෙන්ම මා මෙය අවස්ථාවක් කරගන්නවා කුරුණෑගල හා ඒ අවට සියළුම ප්‍රදේශවල සිටින සියලු Renault මෝටර් රථ පාරිභෝගිකයන් වෙත කුරුණෑගල Siyekra International ආයතනය වෙත පැමිණ ඔබගේ Renault මෝටර් රථයට අදාල සියළුම සේවාවන් හා අමතර කොටස් මිලදී ගන්නා ලෙස විවෘත්ත ආරාධනාවක් කර සිටින අතරම, ඒ සඳහා Siyekra International ආයතනයේ රංජිත් පද්මසිරි මහතා වෙත 0710-333666 අංකයට ඇමතිමෙන් වැඩි විස්තර ලබාගත හැකි බව" ඒ මහතා අවසානයේ කියා සිටියේය.

මෙම නවතම සහයෝගීතාවය තුළින් කුරුණෑගල හා ඒ අවට පාරිභෝගිකයන් හට, වගකීම් කාලය තුළත් ඉන් පසුවත් සිදුකල හැකි සේවාවන් මෙන්ම නියම අමතර කොටස් මිලදී ගැනීමට Siyekra International ආයතනයෙන් සිදුකරගත හැක. එසේම මෙම නවතම ක්‍රියාමාර්ග හරහා Renault මෝටර් රථ නැවත විකිණීමේ වෙළඳපළටද ධනාත්මක බලපෑමක් ඇතිවනු ඇති බව AMW සමාගම විශ්වාස කරන අතරම, නුදුරේදීම 3S සංකල්පය සහිත තවත් සේවා ස්ථාන රැසක් දිවයින පුරා පිහිටුවීමටද මේ වනවිට සියලු කටයුතු සම්පාදනය කර ඇති බව AMW සමාගම සතුටින් දන්වා සිටී.